**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2021 පෙබරවාරි 17　　මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන විධාන　　2021 අංක 02**

## මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම

මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණ සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් වටිනාකම් මත ණය අනුපාත ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් විධාන නිකුත් කරනු ලබයි.

1. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 03 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම සඳහා නිකුත් කරන ලද විධානයෙහි 1 (i) (ආ) විධානය පහත විධානය මඟින් ප්‍රතිස්ථාපනය කෙරේ.

    (ආ) පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිත කරන ලද ලියාපදිංචි වාහන සඳහා අනුපාතය සියයට 80 ක් විය යුතුය.

**මහාචාර්ය ඩබ්ලිව් ඩී ලක්ෂ්මන්**
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති